# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 133 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 24/01/2024 පැය 1920

**මාධ්‍ය නිවේදනය**

**රිය අනතුරකින් පොලිස් නිලධාරියෙකු මියයාම - තිස්සමහාරාමය පොලිස් වසම.**

2024.01.24 වන දින දහවල් කාලයේ තිස්සමහාරාමය පොලිස් වසමේ තිස්සමහාරාමය කතරගම මාර්ගයේ පුංචි අකුරුගොඩ ප්‍රදේශයේදී තිස්සමහාරාමය දෙස සිට කතරගම දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගයේ ද්විත්ව රේඛාව කපා එම දිශාවටම ඉදිරියෙන් ධාවනය වූ අත් ට්‍රැක්ටරයක් ඉස්සර කර ධාවනය කිරීමේදී විරුද්ධ දිශාවෙන් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පසු පැදිකරු බරපතල තුවාල ලබා දෙබරවැව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ කතරගම පොලිස් ස්ථානයට අනුයුක්තව සිටි පොලිස් කොස්තාපල්වරයෙකු වන වැලිමඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය දෙබරවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බස් රථ රියදුරුගේ නොසැලකිලිමත් හා අපරික්ෂාකාරී රිය ධාවනය හේතුවෙන් මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනතුර සම්බන්ධයෙන් වයස අවුරුදු 39 ක් වූ බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තිස්සමහාරාමය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.